# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE




| මගේ අංකය / எனது இல. / My No. | CSS/7/1/1/1/2013 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2015.06. 26 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල් ) 05 / 2015

දකුණු පළාත් සභාවේ,

ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා

ගණන් දීමේ නිලධාරීන් වෙත.

**අක්‍රිය කරන ලද වැට් ලියාපදිංචි තැනැත්තන් සහ තාවකාලික ලියාපදිංචි තැනැත්තන් විසින් අයකරනු ලබන වැට් බදු සම්බන්ධ දැනුවත් කිරිම.**

උක්ත කරුණ සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ( එකතු කල අගය මත බදු) විසින් නිකුත් කර ඇති අංක CIR/VAT/2015/155 හා 2015.05.27 දිනැති ලිපියේ පිටපතක් මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම ලිපිය මඟින් දන්වා ඇති පරිදි, රජයේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සහ සංස්ථාපිත මණ්ඩල වෙත භාණ්ඩ හා සේවා සැපයීමේදී සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් විසින් අක්‍රිය කර ඇති වැට් ලියාපදිංචි අංකයන්ට හා ආනයන හා අපනයන කටයුතු සඳහා ලබා දෙන ලද තාවකාලික ලියාපදිංචි අංකයන් යටතේ වැට් බදු අයකරන නමුත්, එම වැට් බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකරන බව හෙළිදරව් වී ඇති බව දන්වා ඇත. එබැවින් ඔබ අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට අයත් ආයතනවලට භාණ්ඩ හා සේවා සපයන සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්ගේ සක්‍රියතාවය පිළිබඳව විස්තර පහත සඳහන් ආකෘතියට අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වැට් විගණන අංශය වෙත යොමු කිරීමෙන් තහවුරු කර ගෙන ,සක්‍රීය ස්ථිර වැට් බදු ලියාපදිංචි තැනැත්තන්ට පමණක් වැට් බදු ගෙවීම් කරන ලෙස කාරුණිකව දන්වමි.

| ලියාපදිංචි තැනැත්තාගේ නම | ලිපිනය | වැට් ලිපිගොනු අංකය |
|---|---|---|
| | | |

→ 02 පිටුව


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 2234052 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின்-அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එච් එච්.දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"

03. එසේම 2002 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364 (3) අනුව ටෙන්ඩර්කරුවකුට / සැපයුම්කරුවකුට එකතු කල අගය මත බද්ද ගෙවන විට, එසේ ගෙවන ලද බදු පිළිබඳ විස්තර පහත ආකෘතිය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට දන්වන ලෙසටත් , උක්ත ලිපියෙහි සඳහන් උපදෙස් අනුගමනය කිරිමට ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව යටතේ ඇති සියළු ආයතන දැනුවත් කරන ලෙසත් දැනුම් දෙමි.

| වැට් ලිපිගොනු අංකය | පුද්ගලයාගේ / ආයතනයේ නම | ගෙවීම් කල දිනය | ගෙවීම බැර කල කාලය | සැපයුම් වටිනාකම රු. | ගෙවූ වැට් බද්ද රු. | ගෙවූ මුළු මුදල රු. |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

ඩබ්ලිව්.කේ.කේ.අතුකෝරල,

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.

පිටපත් :

01. සහකාර විගණකාධිපති, දකුණු පළාත - දැ.ගැ.ස.

02. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් - දැ.ගැ.ස.

03. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ,දකුණු පළාත - අභ්‍යන්තර විගණනයේදී පරීක්ෂා කිරීමට.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
உள்நாட்டு இறைவரித் திணைக்களம்
# DEPARTMENT OF INLAND REVENUE

17 JUN 2015


වැ.එ.බ. විගණන අංශය
2 වන මහල
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
තැ.පෙ.515
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02, ශ්‍රී ලංකාව.

பெ.சே.வரி கணக்காய்வுக்கிளை
2 வது மாடி
உள்நாட்டு இறைவரித்திணைக்களம்
த.பெ.இல. 515
சேர் சித்தம்பலம் ஏ காடினர் மாவத்தை
கொழும்பு 02, இலங்கை.

VAT Audit Branch
2nd Floor
Department of Inland Revenue
P.O. Box 515
Sir Chittampalam A Gardiner Mawatha
Colombo 02, Sri Lanka.

ෆැක්ස් /பெக்ஸ்/ Fax/ 011-2338924/2338541 දුරකථන / Telephone / தொலைபேசி 0112134250, 0112134251www.inlandrevenue.gov.lk


---

මගේ අංකය: CIR/VAT/2015/155 2015.05.27

ප්‍රධාන ලේකම්
දකුණු පළාත් සභාව
එස්.එච්. දහනායක මාවත
ගාල්ල

**<u>අක්‍රීය කරන ලද වැට් ලියාපදිංචි තැනැත්තන් සහ තාවකාලික ලියාපදිංචි තැනැත්තන් විසින් අයකරනු ලබන වැට්බදු සම්බන්ධ දැනුවත් කිරීම</u>**

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ සංස්ථාපිත මණ්ඩල වෙත භාණ්ඩ හා සේවා සැපයීමේදී සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් විසින් මේ වනවිට අක්‍රීය කර ඇති වැට් ලියාපදිංචි අංකයන්ට හා ආනයන හා අපනයන කටයුතු සදහා ලබා දෙන ලද තාවකාලික ලියාපදිංචි අංකයන් යටතේ වැට් බදු අයකරන බව හෙලිදරව් වී ඇති අතර එසේ අයකරනු ලබන වැට් බදු මුදල්, මෙම දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොමැති බවද තහවුරු වී ඇත.

2013 අංක 17 දරන වැට් බදු සංශෝධිත පනතේ 5(2)(අ) වගන්තියට අනුව 2013.01.01 දින සිට බද්දට යටත් සැපයුම කාර්තුවකට රුපියල් මිලියන 3 හෝ වර්ෂයකට රුපියල් මිලියන 12 ක ලෙස සහ 2015 යෝජිත වැට් බදු සංශෝධන පනතට අනුව 2015.01.01 දින සිට රුපියල් මිලියන 3.75 හෝ වර්ෂයකට රුපියල් මිලියන 15 ලෙස ඉහල නංවා ඇති බැවින්, බදු අයකළ හැකි සැපයුම ඉහත දැක්වූ සීමාවන් ඉක්මවා ප්‍රකාශ නොකරන ලද තැනැත්තන්ගේ එකතු කළ අගය මත බදු ලිපිගොනු දැනටමත් හදුනාගෙන අක්‍රිය කිරීමට පියවර ගෙන ඇත. එම අක්‍රිය කර ඇති වැට් බදු ලිපිගොනු පිළිබදව www.ird.gov.lk දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

**වැට්බදු එකතුකර ගැනීම සඳහා පත්කර ඇති නියෝජිතයා වන්නේ සක්‍රිය ස්ථිර වැට් ලියාපදිංචි තැනැත්තකු පමණි. එබැවින් ඔබ ආයතන විසින් වැට් බදු ගෙවීමේදී එම තැනැත්තා සක්‍රිය ස්ථිර වැට් බදු ලියාපදිංචි තැනැත්තකුද යන්න තහවුරු කර ගැනීම අත්‍යවශ්‍ය වන අතර, එම සක්‍රියතාව තහවුරු කරගත් ස්ථිර ලියාපදිංචි තැනැත්තන්ට පමණක් වැට් බදු ගෙවීම කළයුතුය.**

**පහත සඳහන් ආකෘතිය මගින් සැපයුම්කරුවන්ගේ/කොන්ත්‍රාත්කරුවන්ගේ එකී සක්‍රියතාවය පිළිබඳව විස්තර ලබාගැනීමට දේශීය අදායම් දෙපාර්තමේන්තුවේ වැට් විගණන අංශය වෙත යොමු කිරීමෙන් තහවුරු කරගත හැකිය.**

| ලියාපදිංචි තැනැත්තාගේ නම | ලිපිනය | වැට් ලිපිගොනු අංකය |
|---|---|---|
| | | |

තවද, 2002 සැප්තැම්බර් මස 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364(3) හි 05 කරුණු පරිදි ටෙන්ඩර්කරුවකුට/සැපයුම්කරුවෙකුට එකතු කල අගය මත බද්ද ගෙවන විට එසේ ගෙවන ලද බද්ද පිළිබඳ විස්තර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට දන්වා එවිය යුතුය. එම තොරතුරු පහත ආකෘතිය පරිදි ඉදිරිපත් කිරීම සුදුසු වේ.

| වැට් ලිපිගොනු අංකය | පුද්ගලයාගේ/ආයතනයේ නම | ගෙවීම් කල දිනය | ගෙවීම බැර කල කාලය | සැපයුම් වටිනාකම රු. | ගෙවූ වැට් බද්ද රු. | ගෙවූ මුළු මුදල රු. |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**** සටහන:- රජයේ ආදායම සුරක්ෂිත කරගැනීම සඳහා ඉහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කිරීමට ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති සියළුම ප්‍රාදේශීය කාර්යාල/ උප කාර්යාල/ පළාත් පාලන ආයතනවල නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.**

වඩාත් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා විමසිය යුතු ලිපිනය පහත පරිදිය.

ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (එ.අ.බ.)/ කොමසාරිස් (වැට් විගණන),
වැට් විගණන අංශය,
දෙවැනි මහල,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 02.

දුරකථන : 011 – 2134251
011 - 2134250
011 - 2338924

දේශීය ආදායම් කොමසාරිස්
(එකතු කළ අගය මත බදු ) අංශය.

එම්. එල්. එම්. තාහිර්
කොමසාරිස්
එකතු කළ අගය මත බදු විගණන අංශය
2 වන මහල,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 02.

දේශීය ආදායම් කොමසාරිස්
(එකතු කළ අගය මත බදු ) අංශය

පිටපත: විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව,නො:306/72,පොල්දූව පාර, බත්තරමුල්ල.